# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS


**ජනාධිපතිවරණය 2019 නොවැම්බර් 16**

**මැතිවරණ දින වාර්තාව**

2019 ජනාධිපතිවරණය කිසිදු විශේෂ සිද්ධියකින් තොරව අවසන් වූ බවටත්, ඡන්ද දායකයන්ගේ ඡන්දය ප්‍රකාශ කිරීම 80% - 85% අතර ප්‍රතිශතයක් ගත අතර එය ප්‍රශස්ත මට්ටමක් බවත් අපට නිරීක්ෂණය විය. මෙය මෙතෙක් පැවැති මැතිවරණ වලින් වඩාත්ම නිදහස් හා සාධාරණ මැතිවරණයක් බව සඳහන් වුවද, සුළු සිද්ධීන් කිහිපයක් සහ තරමක් බරපතල එක් සිද්ධියක් පමණක් අප වෙත වාර්තා වී ඇත. මෙම සිද්ධීන් සඳහා ඉතා ඉක්මණින් ගත යුතු ක්‍රියාමාර්ග ගැනීමට පොලීසිය සහ මැතිවරණ කොමිෂම සමත් වීම ධනාත්මක සළකුණක් වන අතර එය රටේ නීතිගරුක භාවය රැකෙන සලකුණක් සේ අප සඳහන් කරමු. එබැවින් මෙම මැතිවරණය නිදහස් හා සාධාරණව පැවැත්වීම වෙනුවෙන් පැෆ්රල් සංවිධානය, මැතිවරණ කොමිෂන් සභාව සහ දිස්ත්‍රික් මැතිවරණ නිලධාරීන් ඇතුළු සියලු දෙනාට ද පොලීසිය සහ මහජන නියෝජිතයින්ට ද කෘතඥතාවය පළ කර සිටිමු.

මැතිවරණ දින වාර්තා වූ සිද්ධීන් අතර, තරමක් බරපතල සිද්ධිය වූයේ අවතැන් වූ පිරිස් තම තමන්ගේ ඡන්ද මධ්‍යස්ථාන අයත් ගම්බිම් සඳහා ප්‍රවාහනය කිරීමේදී වෙඩි තැබීමකට ලක්වීමයි. කෙසේ වුවත් මෙම සිද්ධියෙන් කිසිවෙකුට හානියක් සිදුවී නොමැත. එසේම ආරක්ෂක අංශ විසින් උතුරු ප්‍රදේශයේ යොදවා තිබූ මාර්ග බාධක සම්බන්ධයෙන් ද අර්බුදකාරී තත්ත්වයක් මතුවීම තවත් එක් සිද්ධියකි. අනෙක් වාර්තා ගත සිද්ධීන් අතර පහරදීම්, ඡන්ද දායකයන් වෙත අයුතු බලපෑම් කිරීම්, සළකුණු කරන ලද ඡන්ද පත්‍රිකා ඡායාරූප ගත කිරීම, ඡන්ද පත්‍රිකා ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටතට ගෙන යාමට උත්සහ කිරීම සහ ඡන්ද ප්‍රචාරණ කටයුතු වල යෙදීම මේ අතර වේ. අද දින අපට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව 158 ක් වූ අතර, ඒ අතරින් පැමිණිලි 42ක් ඡන්ද ප්‍රචාරණ කටයුතු සම්බන්ධව ද පැමිණිලි 31 ක් ඡන්ද දායකයන් වෙත අයුතු බලපෑම් කිරීම ද , පැමිණිලි 20ක් ඡන්ද දායකයන් ප්‍රවාහනය කිරීම ද ඇතුලත් වේ.

මෙවර ජනාධිපතිවරණයේ දී අපට නිරීක්ෂණය වූ සුවිශේෂී තත්ත්වයක් වනුයේ හෝමාගම, මාතලේ, නාවුල සහ තවත් ප්‍රදේශ කිහිපයක හොර ඡන්ද දැම්මේ සිදුවීම් කිහිපයක් වාර්තා වීමයි. එසේම ඡන්ද පෙට්ටි මුද්‍රා හරිමින් ඡන්ද පෙට්ටි බලහත්කාරයෙන් පුරවමින් හොර ඡන්ද දැමූ අමිහිරි ඉතිහාසය පසු කළ අප මේ වන විට මැතිවරණ විෂයෙහිලා යම් ශිෂ්ඨ සම්පන්න භාවයකට පත් වෙමින් සිටින මොහොතක සිදුවූ මෙම තත්ත්වය යහපත් ප්‍රවණතාවයක් නොවන බව අප අවධාරණය කරමු. මෙවැනි සිදුවීම් හරහා සිදු වනුයේ මැතිවරණ පිළිබඳ ජනතාවගේ විශ්වාසය බිඳවැටීමයි.

මෙවර ජනාධිපතිවරණයේ නිරීක්ෂණය වූ සමහර අර්බුදකාරී තත්ත්වයන් සඳහා දිගුකාලීන විසඳුම් ලබාගත යුතු බව අපට ප්‍රත්‍යක්ෂ වී ඇත. මූලික අර්බුදකාරී තත්ත්වය වූයේ මාධ්‍ය අනායවශ්‍ය අන්දමින් තම අපේක්ෂකයින් ප්‍රවර්ධනය යොදා ගැනීමයි. මේ අතර ගුවන් කාලය සම සමව ලබා නොදීම සහ ප්‍රතිවාදීන් විවේචනය කිරීම ප්‍රමුඛත්වයක් ගනී. පූර්ව මැතිවරණ සමයේ, නිහඬ කාල සීමාවේ සහ මැතිවරණ දින සමාජ මාධ්‍ය තුළින් මුදා හරින ලද තොරතුරු ලංකාවේ මැතිවරණය නීතිය උල්ලංඝණ


#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.

Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572

Email : paffrel@sltnet.lk Web : www.paffrel.com


කිරීමට ද සමත් විය. රජයේ මාණ්ඩලික නිලධාරීන් ද නීතියේ ඇති දුර්වලතාවයන් මත මැතිවරණ කටයුතු සඳහා යොමු වූ අතර රාජ්‍ය මාණ්ඩලික නිලධාරීන් දේශපාලන කටයුතු වලට ඍජු ලෙස දායකවීම කණගාටුදායක තත්ත්වයකි. එමෙන්ම අපේක්ෂකයන් ප්‍රවර්ධනය වන අන්දමින් රාජ්‍ය දේපළ හා බලය අනවශ්‍ය ලෙස පරිහරණය කිරීම ද තවත් එක් අප්‍රසන්න කරුණක් සේ අප දකිමු.

එසේම දීර්ඝ කාලීන වශයෙන් විසඳුමක් සොයාගත යුතු ගැටළුවක් ලෙස අපට දැක්විය හැක්කේ දුරබැහැර ප්‍රදේශවල සමහර ඡන්ද දායකයින් හට කිලෝමීටර් ගණනාවක් පා ගමනින් ඡන්දපොළ වෙත යාමට සිදුවීම සහ ආබාධ සහිත පුද්ගලයින් හට ප්‍රවේශය නොමැති සමහර ස්ථානවල ඡන්ද පොළවල් පිහිටා තිබීමයි. පැෆ්රල් සංවිධානය මේ අවස්ථාවේදී ආගමික ස්ථාන ඡන්ද මධ්‍යස්ථාන සඳහා යොදා ගැනීම නැවත සළකා බලන ලෙස මැතිවරණ කොමිෂමෙන් ඉල්ලා සිටී. එයට මූලික හේතුව වශයෙන් අපට දැක්විය හැක්කේ අවස්ථා ගණනාවකදීම ආගමික නායකයින් නිශ්චිත අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය කිරීම සඳහා ඡන්ද දායකයින් හට බලපෑම් කිරීමේ සිදුවීම් සිදුව ඇති බව අපට වාර්තා වීමයි. එමෙන්ම තවත් නිශ්චිත ගැටළුවක් අපට දැක්විය හැක්කේ සමහර පළාත් නියෝජනය කරන ආණ්ඩුකාර වරුන් සහ රජයේ සේවකයින් ඉතාමත් විවෘත ලෙස පක්ෂ දේශපාලනය ප්‍රවර්ධනය කිරීම සඳහා දේශපාලන ව්‍යාපාර සමග සම්බන්ධ වී ක්‍රියාත්මක වීම වන අතර මෙම තත්ත්වය කිසි ලෙසක වත් පිළිගත නොහැකි තත්ත්වයක් වන බව අපගේ අදහස යි.

මෙවර ජනාධිපතිවරණය සඳහා 2018 ඡන්ද හිමි නාමලේඛනය යොදා ගෙන ඇති අතර එහි ලියාපදිංචි නොවූ ඡන්ද දායකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට වරම් නොලැබුන බැවින් එය එම ඡන්ද දායකයන්ගේ කණස්සල්ලට හේතුවිය. එබැවින් මෙම ප්‍රශ්නය සඳහා දීර්ඝ කාලීන විසඳුමක් සොයා ගැනීමද අත්‍යවශ්‍ය කරුණක් සේ අපි සඳහන් කරමු.

මෙවර ජනාධිපතිවරණය සඳහා මැතිවරණ දින නිරීක්ෂණ කටයුතු සඳහා පැෆ්රල් සංවිධානය මගින් 4000 කට අධික පුහුණු නිරීක්ෂකයින් යොදවන ලදි. ඔවුන් අතර දිගුකාලීන නිරීක්ෂකයින් 141 ක්ද, දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 30 ක් ද, ක්ෂේත්‍ර සම්බන්ධීකාරක වරුන් 31 ක්ද, ස්ථානගත නිරීක්ෂකයින් 2480 ක් ද , ජංගම නිරීක්ෂකයින් 828 ක් ද, සර්ව පාක්ෂික මෙහෙයුම් මැදිරි සඳහා නිරීක්ෂකයින් 23 ක් විය. ඔවුන් විසින් දිවයින් පුරා පිහිටි සංවේදී සහ තෝරාගත් ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණය කරන ලදි. මීට අමතරව දිස්ත්‍රික් පැමිණිලි මධ්‍යස්ථාන සඳහා නිරීක්ෂකයින් 23 ක් ද , සමාජ මාධ්‍යජාලා නිරීක්ෂණය සඳහා කණ්ඩායම් 2 ක් ද, පැමිණිළි කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා කණ්ඩායම් 2 ක් ද, ඇමතුම් මධ්‍යස්ථානය සඳහා 75 ක් ද යොදවන ලදි.

අවසන් වශයෙන් අප දේශපාලන පක්ෂ නායකයින්, පුරවැසියන්ගෙන් ඉල්ලා සිටින්නේ කුමන අපේක්ෂකයෙකු ජයග්‍රහණය කළද, එය රටේ බහුතර කැමැත්තේ ප්‍රතිඵලය බැවින් ජයග්‍රහණය හෝ පරාජය සම සිතින් විඳ දරා ගන්නා ලෙසත් කිසිදු හේතුවක් මත හිංසාකාරී ක්‍රියාවලට යොමු වීමෙන් වළකින ලෙසත් ය.



රෝහණ හෙට්ටිආරච්චි,
විධායක අධ්‍යක්ෂ